## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - දෙහිඕවිට අධ්‍යාපන කලාපය.

## ප්‍රාථමික අංශය

# මව්බස විෂය (විෂය සමගාමී)

සැකසුම : කේ. ජී අශෝකා මැණිකේ (ගුරු උපදේශක)

දයාබර දෙමව්පියනි වැඩිහිටියනි,
තම තමන්ගේ නිවසේ රැඳී අපි අපේ පුංචි දරුවන්ට භාෂා දැනුම දියුණු කරමු. භාෂා දැනුමෙන් වියුක්තව අන් කිසිදු විෂයක් පිළිබඳව මනා දැනුමක් ලබා ගැනීම අසීරුය. සවන් දීම, කතා කිරීම, කියවීම, ලිවීම යන චතුර්විධ ක්ෂේත්‍ර අරභයා මව්බස විෂය ව්‍යාප්ත වෙයි. විනෝදජනක , නිර්මාණශීලී හා තකර්ානුකූල ඉගෙනුම සඳහා දරුවන්ට අවස්ථාව සලස්වමු.

## 2 ශ්‍රේණිය

## ක්‍රියාකාරකම (සතුටින් උගනිමු)

පියවර 1
ගෙදරට ගෙනෙන එළවළු වල නම් කියවමු.





- වැටකොළු කරලේ දාර කීයද ගණන් කරමු.
- තව වැටකොළු කරල හා සසඳන්න.
- සෑම වැටකොළු කරලක ම දාර ප්‍රමාණය සමාන ද බලන්න.



- කරලේ දාර කීයද? ගණන් කරන්න.
- තවත් කරලක් හා සසදන්න.
- සෑම බණ්ඩක්කා කරලකම දාර ප්‍රමාණය සමාන ද බලන්න.



- කරවිල ගෙඩියේ මතුපිට අතින් පිරිමදින්න අතට  ගොරෝසු බව දැනේවි.
- අමු කරවිල කරල කපා බැලූවිට මදය මොන පාටද ?
- ඉදුණු කරවිල ගෙඩිය කපන විට මදය මොන පාටද ?

මේ සතියේ ගෙදරට ගෙන එන රූප අඳින්න  නම ලියන්න.